**රේගු අතිකාල හා නැව් බඩු පරීක්ෂණ ගාස්තු අරමුදල- 2012**

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 තත්ත්වාගණනය කළ විගණන මතය**

මෙම වාර්තාවේ 1.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2012 දෙසැම්බර් 31 දිනට රේගු අතිකාල හා නැව්බඩු පරීක්ෂණ ගාස්තු අරමුදලේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම්**

**1.2.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**

අරමුදල සඳහා වූ ශේෂ පත්‍රයේ ඇතුළත් එකතුව රු.59,751,687 ක් වූ ණයහිමි ශේෂ 04 ක් හා රු.208,706 ක් වූ ඉතිරි කිරීමේ තැන්පතුවක වූ ආයෝජනවල වටිනාකම අරමුදලේ ඒකාබද්ධ ශේෂ පත්‍රයේ අදාල තීරුවේ දක්වා නොතිබුණි.

**1.2.2 හඳුනා නොගත් ගනුදෙනු**

වර්ෂ ගණනාවක සිට ඉදිරියට ගෙන එමින් පැවැති ජංගම වත්කම් හා ජංගම බැරකම් ශේෂ 08 ක පිළිවෙලින් රු.7,017,198 ක් සහ රු.1,730,375 ක් හඳුනාගෙන නිරවුල් කිරීමට ක්‍රියාකර නොතිබුණි. මේ පිළිබඳව 2008 වර්ෂයේ සිට 2011 වර්ෂය දක්වා අඛණ්ඩව විගණන වාර්තා මගින්ද පෙන්වා දී තිබුණි. ඒ සම්බන්ධයෙන් රේගු අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් ඊළඟ වර්ෂය තුළදී නිවැරදි කිරීමට කටයුතු කරන බව සඳහන් කර තිබුණත්, 2012 වර්ෂය තුළදීද එය නිරවුල් කිරීමට ක්‍රියා මාර්ගයක් ගෙන නොතිබුණි.

### 1.2.3 ලැබිය යුතු ගිණුම්

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2012 දෙසැම්බර් 31 දිනට රු.34,184,264 ක් වූ මුළු ණයගැති ශේෂයෙන් රු. 9,639,109 ක් හෙවත් සියයට 28.2 ක් වර්ෂ 5 කට වැඩි පැරණි ශේෂයන් වූ අතර, ඒ අතරින් රු.24,545,155 ක් හෙවත් සියයට 71.8 ක් වසර 10 ට වඩා වැඩි කාලයක සිට හිඟව පැවතුණි. අයවීම අවිනිශ්චිත තත්ත්වයේ වූ එම ශේෂයන් සඳහා ප්‍රමාණවත් බොල්ණය ප්‍රතිපාදනද සලසා නොතිබුණි. වර්ෂ 7 කටත් වැඩි කාලයක සිට පවතින ණයගැතියන්ගෙන් අදාල මුදල් අයකරගැනීම සඳහා සමාලෝචිත වර්ෂයේදීද විධිමත් ක්‍රියා මාර්ගයක් ගෙන නොතිබුණි. එසේම, ණයගැතියන් ලෙස දක්වා තිබුණු ඇතැම් ආයතනවල පැවත්ම පිළිබඳවද සොයා බලා නොතිබුණි.

(ආ) විවිධ ණයගැති ශේෂය තුළ ඇතුළත් ආයතන 13 කින් අයවිය යුතු එකතුව රු.1,816,630 ක් වූ ණයගැති ශේෂයන්, වර්ෂ ගණනාවක සිට පැවත එන ශේෂ විය. එම ආයතන 13 ට අදාලව විශේෂ තැන්පතු ලෙස රු.2,946,461 ක වගකීමක්ද ශේෂ පත්‍රයේ පැවති අතර එම ශේෂයන් හඳුනාගෙන නිරවුල් කිරීමට ඇති හැකියාව පිළිබඳ අවධානය යොමු කර නොතිබුණි.

(ඇ) ඇතැම් ණයගැති ශේෂයන්ට අදාලව ඇප තැන්පත් ලබාගෙන නොතිබුණි.

### 1.2.4 විශේෂ තැන්පතු හා ආයෝජන

1967 වර්ෂයේ සිට ආයතන 75 කින් ලබාගෙන තිබුණු එකතුව රු. 263,500 ක මූලික තැන්පත් මුදල්, ඉතිරිකිරීමේ ගිණුම්වල ආයෝජනය කිරීමෙන් සමාලෝචිත වර්ෂය අවසාන වන විට රු.10,316,337 ක් පොලියක් ලබාගෙන තිබුණි. එම පොලිය හා මූලික තැන්පත් මුදල් එකතුව රු.10,579,837 ක් සමාලෝචිත වර්ෂයේ ශේෂ පත්‍රයේ විශේෂ තැන්පත් වශයෙන් දක්වා තිබුණි. මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) තැන්පතු ලබා ගැනීමට පාදක වූ අරමුණු සම්බන්ධ ලිඛිත තොරතුරු විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

(ආ) තැන්පතු ලබාගෙන ඇති ආයතනවල පැවැත්ම පිළිබඳව සොයා බැලීමට කටයුතු කර නොතිබුණු අතර එම තැන්පතු ආපසු ගෙවිය යුතු ඒවා බවද තහවුරු නොවුණි.

(ඇ) වර්ෂ ගණනාවක සිට මෙම මුදල් ඉතිරි කිරීමේ ගිණුම්වල ආයෝජනය කිරීම හේතුවෙන් ඉතා අඩු පොලී ආදායමක් උපයා තිබුණු අතර, අදාල මුදල් වෙනත් සුදුසු ආයෝජනයක යෙදීම කෙරෙහි අවධානය යොමු කර නොතිබුණි.

**1.2.5 විගණනය සඳහා සාක්ෂි නොවීම**

පහත සඳහන් විෂයයන් ඉදිරියෙන් දක්වා ඇති සාක්ෂි විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

| | විෂයය | මුදල | ඉදිරිපත් නොකළ සාක්ෂි |
|---|---|---|---|
| | | රු. | |
| (අ) | විවිධ ණයගැතියන් | 34,184,264 | ආයතන 158 කින් හිඟ හිටව පැවති ණයගැති ශේෂවලට අදාල ශේෂ සනාථ කිරීම් |
| (ආ) | ගිණුම් විෂයයන් 08 ක් | 8,747,573 | ශේෂ සනාථ කිරීම් |

**1.2.6 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම**

පහත සඳහන් අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

| | නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට යොමුව | අනුකූල නොවීම |
|---|---|---|
| (අ) | මුදල් රෙගුලාසි<br>මු. රෙ. 175 (2) | 2012 දෙසැම්බර් 31 දිනට වූ රු. 34,184,264 ක හිඟ මුදල් අයකර ගැනීම සඳහා මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. |
| (ආ) | 2009 අප්‍රේල් 16 දිනැති අංක 9/2009 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය සහ 2010 පෙබරවාරි | ශ්‍රී ලංකා රේගුව විසින් වේලාසටහන් යන්ත්‍ර හඳුන්වාදී තිබුණත්, සමාලෝචිත වර්ෂයේදී ශ්‍රී ලංකා රේගු දෙපාර්තමේන්තුවේ කිසිඳු |

| | |
|---|---|
| 19 දිනැති අංක 01/2010 දරන ශ්‍රී ලංකා රේගු දෙපාර්තමේන්තුවේ චක්‍රලේඛය. | නිලධාරියෙකු වේලාසටහන් යන්ත්‍ර භාවිතා කර නොතිබුණු අතර ඒ සම්බන්ධයෙන් කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. |

**1.2.7 අධිකාරි බලයකින් සනාථ නොවන ගනුදෙනු**

ශ්‍රී ලංකා රේගුවේ නිලධාරින්ට දිනකට පැය 12 සිට 27 දක්වා වූ කාල පරාසයක් තුළ මාසයකට පැය 600 ඉක්මවා අතිකාල දීමනා ලබාගත හැකි වන පරිදි අවිධිමත් ලෙස අභ්‍යන්තර රෙගුලාසි පනවා තිබුණු අතර, ඒ සඳහා ලබාගත් අනුමැතිය විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

**2. මූල්‍ය සමාලෝචනය**

**2.1 මූල්‍ය ප්‍රතිඵල**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා අරමුදලේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.145,587,707 ක අතිරික්තයක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂය සඳහා වූ අතිරික්තය රු.171,182,085 ක් වූයෙන් මූල්‍ය ප්‍රතිඵලවල රු.25,594,378 ක පිරිහීමක් පෙන්නුම් කෙරිණි. ඉකුත් වර්ෂයට සාපේක්ෂව අරමුදලේ ආදායම සියයට 2.7 කින් අඩුවීම හා වියදම 2.4 කින් වැඩිවීම මෙම පිරිහීම සඳහා මූලික වශයෙන් බලපා තිබුණි.

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 කාර්ය සාධනය**

**(අ) අතිකාල අරමුදල**

රේගු කාර්ය මණ්ඩලයේ සාමාන්‍ය රාජකාරි වේලාවට අමතර කාලය තුළ සහ රාජකාරි සඳහා රේගුව වසා ඇති දිනවලදී රාජකාරි ඉටු කිරීම වෙනුවෙන් දරන වියදම ආවරණය කිරීම සඳහා බාහිර නිශ්කාෂණ මධ්‍යස්ථාන හා අනෙකුත් ආයතනවලින් අතිකාල මුදල් වශයෙන් අය කෙරෙන මුදල් මෙම අරමුදලට බැර කරන අතර, එකී අතිකාල සේවා වෙනුවෙන් රේගු කාර්ය මණ්ඩලයට කරන ගෙවීම් මෙම අරමුදලේ වියදම් ලෙස සැලකේ.

2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය හා ඉකුත් වර්ෂ 09 කට අදාල අතිකාල අරමුදලේ මූල්‍ය ප්‍රතිඵල පිළිබඳ විග්‍රහයක් පහත දැක්වේ.

| වර්ෂය | ආදායම | වියදම | අතිරික්තය | ඉකුත් වර්ෂයට සාපේක්ෂව මූල්‍ය ප්‍රතිඵලයෙහි වර්ධනය / (පිරිහීම) ප්‍රතිශතයක් ලෙස | අතිරික්තය ආදායමේ ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|---|
| | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන | % | % |
| 2003 | 314.442 | 257.511 | 56.931 | - | 18.11 |
| 2004 | 336.786 | 302.717 | 34.069 | (40.15) | 10.12 |
| 2005 | 381.696 | 367.750 | 13.946 | (59.06) | 3.65 |
| 2006 | 490.012 | 384.789 | 105.223 | 654.52 | 21.47 |
| 2007 | 576.415 | 425.920 | 150.495 | 43.02 | 26.11 |
| 2008 | 576.671 | 424.275 | 152.396 | 1.26 | 26.43 |
| 2009 | 465.837 | 410.236 | 55.602 | (64) | 12.00 |
| 2010 | 583.491 | 416.289 | 167.202 | 200 | 28.64 |
| 2011 | 593.065 | 421.883 | 171.182 | 2.38 | 28.86 |
| 2012 | 577.392 | 431.805 | 145.587 | (14.95) | 25.21 |

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

ශ්‍රී ලංකා රේගුවේ කාර්ය මණ්ඩලය වෙනුවෙන් සමාලෝචිත වර්ෂය තුළ අතිකාල අරමුදලින් දැරිය යුතු අතිකාල වියදම් දරා තිබියදී හා දෙපාර්තමේන්තු වැය ශීර්ෂයෙන් අතිකාල වශයෙන් රු.2,597,260 ක් වැය කර තිබියදී අතිකාල අරමුදලේ අතිරික්තය ඒකාබද්ධ අරමුදලට බැර කිරීමට පියවර ගෙන නොතිබුණි.

**(ආ)** රේගු නැව් බඩු පරීක්ෂණ ගාස්තු අරමුදල

---

රේගු නිලධාරින් විසින් සාමාන්‍ය රාජකාරි ස්ථානයෙන් බැහැරව පරීක්ෂණ රාජකාරිවල යෙදීම වෙනුවෙන්, භාණ්ඩ නිශ්කාෂණය කරගනු ලබන පාර්ශවයන් වෙතින් අය කරන

පරීක්ෂණ ගාස්තුවලින් සියයට 50 ක් රේගු නැව් බඩු පරීක්ෂණ ගාස්තු අරමුදලට බැර කරන අතර, එම මුදල් නිලධාරින්ට දීමනා ගෙවීම සඳහා භාවිතා කරනු ලබයි. ඒ අනුව සමාලෝචිත වර්ෂය තුළ රු.200,913,004 ක් අරමුදලට ලැබී තිබුණු අතර, ඉදිරියට ගෙනා ශේෂයද ඇතුළු මුළු මුදල රු.452,982,826 ක් විය. සමාලෝචිත වර්ෂය තුළ රු.161,995,774 ක් වැය කර තිබුණි. ඉකුත් වර්ෂය අවසානයේදී රු.252,069,822 ක් වූ අරමුදලේ තැන්පතු ප්‍රමාණය සමාලෝචිත වර්ෂය අවසානයේදී රු.290,987,052 ක් දක්වා වර්ධනය වී තිබුණි.

**3.2 මතභේදයට තුඩුදෙන ගනුදෙනු**

**---------------------------------**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ශ්‍රී ලංකා රේගුවේ අතිකාල ගෙවීම් ක්‍රියාවලිය මතභේදාත්මක බව ඉකුත් වර්ෂවල විගණකාධිපති වාර්තා මගින් පෙන්වා දී තිබුණු අතර සමාලෝචිත වර්ෂයේදීද තාත්වික නොවන අයුරින් අතිකාල ගෙවීම් සිදු කර තිබුණි. 2012 ජනවාරි සිට මාර්තු දක්වා මාස 03 ක කාලපරිච්ඡේදය තුළ අපනයන අංශයේ නිලධාරින් 06 දෙනෙකු සම්බන්ධයෙන් සිදු කළ නියැදි විගණන පරීක්ෂාවේදී එක් එක් මාසය සඳහා සෑම නිලධාරියෙකුටම පැය 600 සිට පැය 663 ක් දක්වා වූ පරාසයක ප්‍රමාණයකින් අතිකාල සේවයේ යෙදී ඇති බව නිරීක්ෂණය විය. එමෙන්ම, එක් එක් මාසය තුළ ඒ ඒ නිලධාරියාට ගෙවා තිබුණු අතිකාල වැටුප් ප්‍රමාණය රු.27,499 සිට රු.33,393 ක් දක්වා වූ පරාසයක පැවතුණි. තවද, මෙම නිලධාරින්ගේ දෛනික අතිකාල සේවයේ සාමාන්‍ය දිනකට පැය 20 ඉක්මවා තිබුණි.

(ආ) ඉහත සඳහන් පරිදි අතිකාල ගෙවීම් සිදු කළ කාලපරිච්ඡේදය සඳහාම නිලධාරින්ට නැව්බඩු පරීක්ෂණ ගාස්තු ලෙසද අසාමාන්‍ය ලෙස ගෙවීම් සිදු කර තිබුණි. මේ පිළිබඳ නිලධාරින් 08 දෙනෙකු සම්බන්ධයෙන් සිදු කළ නියැදි විගණන පරීක්ෂාවේදී අනාවරණය වූයේ එක් නිලධාරියෙකුට රු.21,678 සිට රු.29,421 දක්වා වූ පරාසයක් තුළ මාසික අතිකාල වැටුප් ගෙවා තිබියදී, එම මාසය සඳහාම රු.44,680 සිට රු.89,246 ක් දක්වා වූ පරාසයක් තුළ නැව් බඩු පරීක්ෂණ ගාස්තු ලෙස මුදල් ගෙවා තිබුණු බවයි. ඇතැම් නිලධාරීන්ට එක් මාසයක් තුළ රු. 128,000 ද ඉක්මවා නැව් බඩු පරීක්ෂණ ගාස්තු දීමනා ගෙවා තිබුණි.

(ඈ) බැදුම්කර සහ ගමන්බඩු යන අංශවලින් 2012 පෙබරවාරි මස සිට අප්‍රේල් දක්වා මාසවල ගෙවීම් තහවුරු කෙරෙන ලියවිලි විගණනයට ඉදිරිපත් කරන ලෙස දන්වා තිබුණත් 2013 ඔක්තෝබර් මස වන විටත් අදාල තොරතුරු ඉදිරිපත් කර නොතිබුණි. 2008 හා 2009 වර්ෂවල අපනයන අංශයට අදාල තොරතුරු පරිගණකයෙන් මැකී තිබුණු බව වාර්තා කර තිබුණත් 2010 හා 2011 වර්ෂවලදීද එම තොරතුරු ඉදිරිපත් කර නොතිබුණි. ඒ අනුව නැව් බඩු පරීක්ෂණ ගාස්තු වශයෙන් 2008 සිට 2011 වර්ෂය දක්වා ගෙවා තිබුණු එකතුව රු.762,969,822 කද සමාලෝචිත වර්ෂයේදී ගෙවා තිබුණු රු.161,995,774 කද නිවැරදිතාව පරීක්ෂා කිරීයට නොහැකි විය.

(ඈ) ඉහත සඳහන් පරිදි අතිකාල වැටුප් හා නැව් බඩු පරීක්ෂණ ගාස්තු ලෙස දීමනා ගෙවා තිබුණේ නිලධාරීන්ගේ මාසික වැටුප්, දිරි දීමනා හා ත්‍යාග මුදල් ආදියට අතිරේක වශයෙනි. නිලධාරීන් බොහොමයකගේ අතිකාල ඉපයීම් මාසික ඒකාබද්ධ වැටුපද ඉක්මවා පැවතුණි. බොහෝ නිලධාරීන් වර්ෂය පුරාම නිවාඩු නොලබා සේවයෙහි නියුක්තව සිට ඇති පදනම මත පිහිටා ගෙවීම් කර තිබුණු අතර එය තාත්ත්වික නොවීය.

(ඉ) ඉහත දැක්වූ තත්ත්වයන් විධිමත් කිරීම සඳහා අතිකාල දීමනා හා බාහිර පරීක්ෂණ ගාස්තු සම්බන්ධ යල්පැනගිය රෙගුලාසි සංශෝධනය කළ යුතු වුවද, ඒ සම්බන්ධයෙන් කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙනා නොතිබුණි.

## 3.3 කළමනාකරණ අකාර්යක්ෂමතා

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

අරමුදලේ පරිහරණය නොකළ මුදල් භාණ්ඩාගාර තැන්පතු ලෙස වර්ෂයෙන් වර්ෂය ඉදිරියට ගෙනවිත් තිබුණු අතර, එම තැන්පතු ගිණුමේ ශේෂය සහ අරමුදල් ශේෂයන් පහත දැක්වෙන පරිදි වර්ධනය වීමක් පෙන්නුම් කෙරිණි. එම මුදල් පිළිබඳව භාණ්ඩාගාරය සමඟ සාකච්ඡා කර අවශ්‍ය පියවර ගෙන නොතිබුණි

| වර්ෂය | අතිකාල අරමුදල | නැව්බඩු පරීක්ෂණ ගාස්තු අරමුදල | භාණ්ඩාගාර තැන්පතු ගිණුමේ ශේෂය |
|---|---|---|---|
| | රු. | රු. | රු. |
| 2005 | 28,007,949 | - | 28,007,949 |
| 2006 | 254,940,825 | 93,672,857 | 348,613,682 |

| | | | |
|---|---|---|---|
| 2007 | 451,423,786 | 157,259,952 | 608,683,738 |
| 2008 | 616,810,938 | 246,576,326 | 863,387,264 |
| 2009 | 669,350,013 | 322,004,787 | 991,354,800 |
| 2010 | 849,082,264 | 369,645,856 | 1,218,728,120 |
| 2011 | 1,022,822,795 | 252,069,822 | 1,274,892,617 |
| 2012 | 1,176,009,046 | 290,987,052 | 1,466,996,098 |

**4. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය**

**අයවැය ලේඛණමය පාලනය**

අයවැය ලේඛනය අනුව ආදායම් හා වියදම් සහ තථ්‍ය ආදායම් හා වියදම් අතර ප්‍රමාණාත්මක විචලනයන් අනාවරණය වූයෙන් අයවැය ලේඛනය ඵලදායී කළමනාකරණ පාලන කාරකයක් ලෙස යොදාගෙන නොතිබුණු බව නිරීක්ෂණය විය.

**5. පද්ධති හා පාලනයන්**

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින්වර රේගු අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ අවධානයට යොමු කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතුය.

(අ) හිඟ ආදායම්

(ආ) අතිකාල ගෙවීම්

(ඇ) ගිණුම්කරණය

(ඈ) බහලුම් පරීක්ෂණ කටයුතු

(ඉ) කාර්ය මණ්ඩල පාලනය.